## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# පාලි

12 සහ 13 ශ්‍රේණි

## විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## 1.0 විෂය හැඳින්වීම

ජාතික අවශ්‍යතාවන්ට උචිත අයුරින් විෂයමාලාවන් සකස් කිරීම කාලීනව සිදුවන්නකි. නිපුණතා පාදකව සිදුවන වර්තමාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අනුව පාලි භාෂාවේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර ඇත. සිංහල භාෂාවට මව් බසක් වූ පාලි භාෂාව බුදුසමය සමග ම ලක් වැසියන්ට ලැබුණු දායාදයකි. බුද්ධ කාලයේ පටන් වර්තමානය දක්වා විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ පාලි භාෂාවෙන් ලියවී ඇති ත්‍රිපිටකය ආදි කොටගත් ග්‍රන්ථ සම්භාරය අතිවිශාලය. පාලිය හුදෙක් බසක් හා සාහිත්‍යයක් පමණක් නොවේ. එය බුදුසමය හා බැඳුණු ගැඹුරු වූත් සනාතන වූත් සාරධර්ම පද්ධතියකි.

පාලි භාෂාවෙන් සුරැකී ඇති ලෝක විෂය පිළිබඳ ඥානය හා ලෝකාන්වීක්ෂණය දිනෙන් දින වඩ වඩාත් අර්ථවත් වන බව පෙනේ. ලෝකය පිළිබඳව බටහිර ජාතීන් අවිද්‍යාවේ ගිලී සිටි යුගයක චූලනිකා ලෝකධාතු, මජ්ඣිමිකා ලෝකධාතු, මහා ලෝකධාතු, වශයෙන් ගැලැක්සි හා ගැලැක්සි පද්ධතීන් පිළිබඳව ලෝකයේ මුල්වරට පැවසී ඇත්තේ පාලි සාහිත්‍යයේය.

පාලි සාහිත්‍යය මගින් අපට ලැබුණේ අතිමහත් ඥානසම්භාරයක් පමණක් නොව මුළුමහත් සමාජය ම සුන්දර කළ සංස්කෘතියකි. පරෝපකාරය, මානුෂික දයාව, අන්‍යෝන්‍ය ගෞරවය පදනම් කර ගත් නීති ගරුක සදාචාරවත් හර පද්ධතියක් එහි විය.

පාලිය මළ බසක් නොවේ. ඈත යුගයේ පටන් පතපොත ලිවීමට මෙම භාෂාව යොදා ගැනිණ. බුරුමය, සියම, කාම්බෝජය ඉන්දියාව, ජාවා ආදී පෙරදිග රටවලින් මෙරටට පැමිණි බෞද්ධයන් මෙරට වියතුන් හා අදහස් හුවමාරු කර ගත් ජාත්‍යන්තර භාෂාව වූයේ ද පාලියයි. ''පාලිය දත් අයට අනුන්ගේ පහනෙන් එළිය බලන්නට උවමනා නැත. මැනවින් හිරුඑළිය තිබේනම් සඳ එළිය අවශ්‍ය නොවේ.'' යනුවෙන් කේ. ඊ. නොයිමාන් (K.E. Neyman) වැනි පඬිවරුන් පාලි භාෂාවේ වැදගත්කම අවධාරණය කොට ඇත්තේ එබැවිනි.

සුන්දර සාහිත්‍යයක්, සනාතන අගයක් ඇති දර්ශනයක්, ප්‍රබුද්ධ චිත්තාකල්ප ජනනය කරන චින්තන ක්‍රමයක් ගැබ් කර ගත් මේ සරළ ප්‍රියංකර භාෂාව ඉගෙනුමට දුෂ්කර වන්නක් නොවේ. එහි පදමාලාව සිලිටිය, සුබනම්‍යය. පාලි භාෂාව හදාරන්නට ගන්නා වෙහෙස හුදෙක් නව භාෂාවක් ඉගෙන ගැනීම සඳහා පමණක් දරන වෙහෙසක් නොවේ. එය අතිශය නවීන ජීවන දර්ශනයක්, තර්කානුකූල විද්‍යාත්මක චින්තනයක් මෙන්ම තම ජීවිතය වෙත නව ආදර්ශ මාලාවක් උරුම කර ගන්නට දරන උදාර ප්‍රයත්නයකි.

මේ සඳහා අ.පො.ස. (උ.පෙ.) පාලි විෂය නිර්දේශය, නිපුණතා 10 ක් යටතේ නිපුණතා මට්ටම් 48 වශයෙන් දක්වා ඇත. මෙම නිපුණතා දහය, දොළොස්වන ශ්‍රේණිය සඳහා නිපුණතා මට්ටම් 22 ක් ලෙස ද, දහතුන්වන වැනි ශ්‍රේණිය සඳහා නිපුණතා මට්ටම් 26 ක් ලෙස ද වෙන් කර ඇත. සමස්ත නිපුණතාවන් සම්පූර්ණ කිරීමෙන් දැනුම ආකල්ප කුසලතා සහ යහපත් ජීවන පුරුදුවලින් පිරිපුන් මනා පෞරුෂයකින් හෙබි මනුෂ්‍ය ප්‍රජාවක් බිහිකිරීම අපේක්ෂා කෙරේ.

## 2. 0 පාලි භාෂාව විෂයයේ අරමුණු

- ශ්‍රවණය, කථනය කියවීම ලිවීම යන චතුර්විධ භාෂා කුශලතා සංවර්ධනය කර ගැනීම.
- බෞද්ධ සංස්කෘතිය ආශ්‍රිත චාරිත්‍ර වාරිත්‍ර විධි පාලි භාෂාවෙන් සිදුවන බැවින් ඒවායේ වටිනාකම තක්සේරු කර ගැනීම.
- ජාතික ඉතිහාසය හා අනන්‍යතාව තහවුරු කර ගැනීමට අවශ්‍ය වංසකථා කියවා තේරුම් ගැනීම.
- නිර්මාණකරණයට හා ශාස්ත්‍රීය රචනාකරණයට අවශ්‍ය ව්‍යාකරණ ඥානය හා වාග්මාලාව පෝෂණය කර ගැනීම.
- පාලි භාෂාවෙන් ඇති ලේඛන කියවා ඒවායේ අන්තර්ගතය සියබසට පරිවර්තනය කිරීම.
- අර්ථ කථා, ටීකා ප්‍රකරණ ආදිය කියවා ධර්මාර්ථ විවරණය කිරීමේ හැකියාව ලබා ගැනීම.
- ත්‍රිපිටක සාහිත්‍යයේ සංවර්ධනය ක්‍රම විකාශය පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
- භාෂා සාහිත්‍යය හැදෑරීමෙන් ලබන අත්දැකීම් පදනම් කරගෙන රටට අවශ්‍ය යහපත් පෞරුෂයකින් හෙබි චරිත බිහිකිරීම.

## අ. පො. ස. (උසස් පෙළ) පාලි විෂය

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 1.3,  2.1, 2.2, 3.1, 3.2, 3.3, 4.1 | 100 |
| | II | 4.2, 4.3, 4.4, 5.1 | 100 |
| | III | 6.1, 6.2, 7.1, 8.1, 9.1, 9.2, 10.1, 10.2, 10.3 | 100 |
| 13 | I | 1.0, 1.2, 1.3, 2.1, 2.2, 2.3, 3.1,3.2, 3.3, 4.1 | 100 |
| | II | 4.2, 4.3, 4.4, 5.1, 5.2, 6.1, 6.2, 7.1, 7.2, 7.3, | 100 |
| | III | 8.1, 8.2, 9.1, 9.2, 10.1, 10.2 | 100 |

# 3. 0 අ. පො. ස. (උසස් පෙළ) පාලි විෂය නිර්දේශය.

## 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදිව භාවිත කරයි. | 1.1 පාලි වර්ණමාලාව නිවැරදිව හැඳින ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය හා සංයුක්තාක්ෂර පිළිබඳ සැලකිලිමත් වෙමින් ලියයි. | • අක්ෂර මාලාවේ ප්‍රභේද<br>• ස්වර ව්‍යඤ්ජන<br>• සංයුක්තාක්ෂර<br>• අක්ෂර උප්පත්ති ස්ථාන | 10 |
| | 1.2 මූලික භාෂා ප්‍රයෝග උපයෝගී කර ගනිමින් වාක්‍ය නිර්මාණය හා රචනය හුරු කර ලියයි. | • උක්ත ආඛ්‍යාත භාවිතය<br>• කර්ම කාරක කතෘකාරක වාක්‍යය<br>• කාරක හා උපපද විභක්ති<br>• ත්‍රෛකාලික ක්‍රියා භාවිතය | 25 |
| | 1.3 මූලික ව්‍යාකරණාංග හැඳිනගෙන පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයේ යෙදෙයි. | • සන්ධි හා එහි ප්‍රභේද<br>• අ,ඉ,ඊ,උ,ඌ අන්ත පුල්ලිංග නාම<br>• ආ,ඉ,ඊ. අන්ත ස්ත්‍රීලිංග නාම<br>• අ,ඉ,ඊ, අන්ත නපුංසක ලිංග නාම<br>• පූර්වක්‍රියා, කෘදන්ත ක්‍රියා, උපසර්ග, නිපාත<br>• සමාස නාම | 25 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 2.0 නිවැරදි වාචික සන්නිවේදනයේ යෙදෙයි. | 2.1 පාලි සම්ප්‍රදායානුකූලව ප්‍රශ්න අසයි.<br><br>2.2 අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයයි. | • නිර්දිෂ්ට ජාතක කථාවක සංවාදයක් තේරුම් ගැනීම<br>• කිං ශබ්දය ඇසුරෙන් ප්‍රශ්න සැකසීම<br>• ප්‍රශ්නවාචක නිපාත උපයෝගී කරගෙන ප්‍රශ්න ඇසීම<br>• අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු දීම<br>• අසන ලද ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු ලිවීම | 20 |
| 3.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය ඡේද කියවා භාවිතයට හුරුවෙයි. | 3.1 පාලි ගද්‍ය පද්‍ය ඡේද නිවැරදිව උච්චාරණය කරයි.<br><br>3.2 රිද්මයානුකූලව සජ්ඣායනය කරයි.<br><br>3.3 සුවිශේෂී පාලි පාඨ වනපොත් කරයි. | • නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මහාප්‍රාණ අල්ප ප්‍රාණ නො බිඳ උච්චාරණය කිරීම<br>• රතන සූත්‍රය සජ්ඣායනය කිරීම<br>• රතන සූත්‍රය වනපොත් කිරීම<br>• නිර්දිෂ්ට තවත් සුවිශේෂි පාඨ හා ගාථා වන පොත් කිරීම | 10 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 4.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 4.1 අන්වය හැඳින ගනියි. | • මහාවංසයේ හා, ථේර-ථේරීගාථාවල අන්වය ඉගෙනීම<br>• අනිර්දිෂ්ට ගාථාවල අන්වය කීම හා ලිවීම | 25 |
| | 4.2 ක්‍රියාකාරක පද සම්බන්ධය නිවැරදිව තේරුම් ගනියි. | • මහාවංසය, ධම්මපද, ථේරගාථා, ථේරීගාථා, සහ වණ්ණුපථ සේරිවාණිජ, චුල්ලසෙට්ඨි ජාතික කියවා ඒවායේ ක්‍රියා කාරක පද සම්බන්ධයට අනුව අර්ථ කීම | 15 |
| | 4.3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි. | • ඉහත දැක් වූ ගද්‍ය පද්‍ය කොටස් මාධ්‍ය භාෂාවට නැගීම<br>• මාධ්‍ය භාෂාවෙන් ලිවීම<br>• පාලි භාෂාවතරණ ෂෂ පොතෙහි අභ්‍යාස 10 ක් පරිවර්තනය කිරීම | 30 |
| | 4.4 මාධ්‍ය භාෂාගත ඡේද රීතියට අනුව පාලියට නගයි. | • මාධ්‍ය භාෂාගත පාඨ 10ක් පාලියට නැගීම. | 30 |
| 5.0 කියවා අර්ථය අවබෝධ කර ගනියි. | 5.1 පාලි ඡේදයක් කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | • අනිර්දිෂ්ට පාලි ඡේද 10ක් ඇසුරෙන් ප්‍රශ්න විමසීම, රසවාහිනී, ධම්මපදට්ඨකථා වැනි භාෂා රටා ඇති ග්‍රන්ථවලින් උද්ධෘතයි. | 10 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 6.0 පාලි භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 6.1 භාෂා සාහිත්‍යාගත හරධර්ම පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br><br>6.2 එහි සමාජ-සංස්කෘතික උපයෝගීතාව අවබෝධ කර ගනියි. | • ලෝක පාලක ධර්ම :- පුඤ්ඤ,පාප,පංචශීල පාරමිතා, ත්‍රිවිධ ශික්ෂා ආදිය දැනගැනීම සඳහා නිර්දිෂ්ට කෘති කියවීම<br><br>• ලෝක පාලක ධර්ම :- පරිසර සංරක්ෂණ, චින්තන නිදහස ආදී ධර්ම, සමාජ සුභසාධනයට ඉවහල් වන අයුරු පැහැදිලි කිරීම | 25 |
| 7. 0 සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි. | 7.1 ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා නිර්මාණයන්හි අන්තරගත කාව්‍යෝපක්‍රම හඳුනා ගෙන ලියා දක්වයි. | • නිර්දිෂ්ට ථේර ථේරී ගාථා, මහාවංසය, ජාතක කථා යන මේවායේ ඇතුළත් උපමා රූපක ස්වභාවෝක්ති, අනුප්‍රාස ආදි සුවිශේෂී කාව්‍යාත්මක යෙදුම් හා ප්‍රකාශන උද්ධෘත කර නම් කිරීම. | 15 |
| 8.0 භාෂා සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය වටහා ගෙන ඒවා සමාජ සහජීවනය ගොඩනගා ගැනීමට උපයෝගී කර ගනියි. | 8.1 පාලි සාහිත්‍යාගත සුවිශේෂී බෞද්ධ සංකල්ප හැඳිනගෙන ඒවායේ සංස්කෘතික වැදගත්කම හදාරයි. | • පංච ශීලය, පුඤ්ඤපාප, කුසලාකුසල සතර බ්‍රහ්ම විහරණ පාරමිතා, ත්‍රිවිධ ශික්ෂා ආදීයෙහි සංස්කෘතික වැදගත්කම | 15 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 9.0 පාලි සාහිත්‍යයේ ව්‍යුහමය වර්ගීකරණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි. | 9.1 ත්‍රිපිටක සාහිත්‍යය වර්ගීකරණය කරයි.<br><br>9.2 පාලි සාහිත්‍යයේ ව්‍යුහය හඳුනාගැනීම සඳහා කියවයි. | • පාලි සාහිත්‍යය පොත ඇසුරෙන් ත්‍රිපිටකයේ වර්ගීකරණය, අන්තර්ගත ග්‍රන්ථමාලාව, බණවර සූත්‍ර හා වර්ග පිළිබඳ අවබෝධය ලබා ගැනීම<br><br>• පෙළ, අටුවා, ටීකා, ප්‍රකරණ, ව්‍යාකරණ ආදී පාලි සාහිත්‍යයේ ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම | 20 |
| 10.0 අර්ථ විවරණ හැකියා වර්ධනය කර ගනියි. | 10.1 නිර්දිෂ්ට කෘතිවල ඇතුළත් විශේෂ පද විග්‍රහ (ව්‍යාකරණ විභාග) කරයි.<br><br>10. 2 ඒවායෙහි ධර්මාර්ථ විවරණය කරයි.<br><br>10. 3 නිර්දිෂ්ට පාඨවල, පසුබිම හැඳින ගනියි. | • නිර්දිෂ්ට කෘතිවල ඇතුළත් විශේෂ පදවල ව්‍යාකරණ ප්‍රභේද ආදී විස්තර දැක්වීම.<br><br>• ඒවායේ ධර්ම කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම<br><br>• උධෘතය තෝරාගත් කෘතිය, එහි නිදානය, අටුවා කථාව ආදිය පිළිබඳ දැනුම ලබාගැනීම | 25 |

## 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ ප්‍රයෝග නිවැරදිව භාවිත කරයි. | 1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූලව ලේඛන කාර්යයේ යෙදෙයි. | • සුවිශේෂී නාම වරනැගීම<br>• සංඛ්‍යා නාම වරනැගීම<br>• සර්වනාම වරනැගීම<br>• තද්ධිත පද සාධනය<br>• කෘදන්ත පද සාධනය<br>• ධාතු ගණ හා වරනැගීම<br>• ප්‍රයෝජ්‍ය ක්‍රියා | 15 |
| | 1.2 සාම්ප්‍රදායික යෙදුම් හා වචනමාලාව පිළිබඳ අවධානය යොමුකරමින් භාෂාව භාවිත කරයි. | • ප්‍රශ්නවාචී නිපාත<br>• විධික්‍රියා<br>• ආමන්ත්‍රණ පද<br>• විශ්මය වාචී යෙදුම්<br>• යුගල පද<br>• බේදාර්ථ පද | 15 |
| | 1.3 භාෂා ව්‍යවහාරයට අනුකූලව රචනය හුරු කර ලියයි. | • පාලි භාෂාවේ උපයුක්ත වාක්‍ය රටාවන් අවබෝධ කර ගෙන රචනා ලිවීම. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 2.0 නිවැරදි වාචික සන්නිවේදනයේ යෙදෙයි. | 2.1 පාලියෙන් අදහස් නිවැරදිව ප්‍රකාශ කරයි.<br><br>2.2 පොත පත කියවීමෙන් ස්මරණය කළ කරුණු වාචිකව ඉදිරිපත් කරයි.<br><br>2.3 නිවැරදිව බස හසුරුවමින් නිවේදන කාර්යයේ යෙදෙයි. | • මාතෘකානුකූලව කරුණු රැස්කිරීම හා කථා කිරීම<br>• සූත්‍ර පාඨ, උපයෝගී කර ගෙන ධර්ම දේශනා පැවැත්වීම, නිර්දිෂ්ට ජාතක කථාවක සංවාදයක්.<br>• උධෘත පාඨ ගෙන හැර දක්වමින් භාෂාව හා ධර්මය පිළිබඳ කථා කිරීම.<br><br>• පාලි සමිතියක් පැවැත්වීම.<br>• එහි කටයුතු පාලියෙන් මෙහෙයවීම<br>• විශේෂ පාලි දිනයේදී පාලියෙන් කථා කිරීම. | 30 |
| 3. 0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය ජේද කියවා භාවිතයට හුරුවෙයි. | 3.1 පද්‍යයක් නිවැරදි වීරිතට හා යතියට අනුව ලයාන්විතව ගායනා කරයි.<br><br>3.2 සූත්‍ර ධර්ම ශ්‍රැති ගෝචර රටාවෙන් හඬනගා ඉදිරිපත් කරයි.<br><br>3.3 උපයෝගීතාවෙන් යුතු ගද්‍ය පද්‍ය පාඨ වන පොත් කරයි. | • නමස්කාර ගාථා තාලයට කීම, පන්සිල් දීම, දේවාරාධනය<br><br>• පිරිත් කීම<br><br>• නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල එන සුවිශේෂි පාඨ කටපාඩම් කිරීම | 10 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 4.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 4.1 අන්වය හා ක්‍රියාකාරක පද සම්බන්ධතාව නිවැරදිව සකස් කිරීමේ පරිචය ලබයි. | • රතන සූත්‍රය හා ධම්මික සූත්‍රයේ පද්‍ය සඳහා අන්වය හා ක්‍රියා කාරක පද සම්බන්ධය සැකසීම; තණ්ඩුලනාලිජාතකය, දේවධම්මජාතකය යන ඒවායේ ක්‍රියාකාරක පද සම්බන්ධය ගැළපීම | 30 |
| | 4.2 පාලි උද්ධෘත මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි. | • ධම්මිකසුත්ත, තණ්ඩුලනාලිජාතකය දේවධම්ම ජාතකය හා අනිර්දිෂ්ට පාඨ මාධ්‍ය භාෂාවට නැගීම | 35 |
| | 4. 3 පාලි උද්ධෘත සඳහා පදගතාර්ථ සපයයි. | • නිර්දිෂ්ට පාඨ සඳහා පදගතාර්ථ ලිවීම | |
| | 4.4 මාධ්‍ය භාෂාගත ජේද පාලි රීතියට අනුකූලව පරිවර්තනය කරයි. | • පාලි භාෂාවතරණය ෂෂ පොතෙහි අභ්‍යාස ද සමග මාධ්‍ය භාෂාගත ජේද 10ක් පාලියට නැගීම | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 5.0 කියවා අර්ථය අවබෝධ කර ගනියි. | 5.1 පාලි ඡේද හා පද්‍ය කියවා අසන ලද ප්‍රශ්න සඳහා මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සපයයි.<br><br>5.2 පාලි උද්ධෘ පාඨ කියවා ඒවායේ සාරාංශය මාධ්‍ය භාෂාවෙන් දක්වයි. | • අටුවා හා ප්‍රකරණ ග්‍රන්ථවල අරුත් අවබෝධ කර ගැනීම<br><br>• පාලියේ ඇති යෙදුම් අවබෝධ කර ගැනීම | 25 |
| 6.0 පාලි භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 6.1 භාෂා සාහිත්‍යාගත හරධර්ම හැඳින ගෙන ඒවා චරිතායනය කරයි.<br><br>6.2 හරධර්ම සමාජගත කිරීමට කටයුතු කරයි. | • ආත්ම සංයමය, සිල්වත්වීම, ත්‍රිශික්ෂා ආදිය ඉගෙන ඒවා තම ජීවිතයට යොදා ගැනීම<br><br>• ධර්ම දේශනා පැවැත්වීම, භාවනා පුහුණුව ආදී කටයුතුවල නියැලීම | 15 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.0 සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි. | 7.1 ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා රසවිඳියි.<br><br>7.2 ගද්‍ය පද්‍ය නිර්මාණ පිළිබඳ රසාත්මක විචාරණයේ යෙදෙයි.<br><br>7.3 ගද්‍ය රචනා නිර්මාණය කරයි. | • නිර්දිෂ්ට ජාතක කථා, ථේරගාථා-ථේරී ගාථා, මහාවංසය, කියවීම<br><br>• නිර්දිෂ්ට ජාතක කථා ථේර ථේරී ගාථාවල කාව්‍යාමය ලක්ෂණ, සාහිත්‍ය පසුබිම ගැන කරුණු හැදෑරීම<br><br>• ගද්‍ය රචනා නිර්මාණය කිරීම | 25 |
| 8.0 පාලි භාෂා සාහිත්‍යයේ අන්තර්ගත බෞද්ධ සංස්කෘතිය වටහා ගෙන ක්‍රියා කරයි. | 8. 1 බෞද්ධ සංකල්පවල ආගමික දාර්ශනික වැදගත්කම හදාරයි.<br><br>8. 2 පාලි සාහිත්‍යාගත බෞද්ධ සංකල්ප වෙනත් ආගමික ඉගැන්වීම් හා තුලනය කරයි. | • සතර බ්‍රහ්ම විහරණ, චින්තන නිදහස, කුසල, අකුසල, ත්‍රිශික්ෂා, පාරමිතා<br><br>• බ්‍රහ්මණ-ශ්‍රමණ ඉගැන්වීම් සසඳා බැලීම | 35<br><br>20 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 9.0 පාලි සාහිත්‍යයේ ව්‍යුහමය වර්ගීකරණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි. | 9. 1 ත්‍රිපිටක සාහිත්‍යයේ අන්තර්ගතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට කියවයි.<br>9. 2 පාලි සාහිත්‍යයේ සුවිශේෂී ග්‍රන්ථවල සංඥාදී පංචකය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට කියවයි. | • ත්‍රිපිටක සාහිත්‍ය පිළිබඳ ලියවුණු ලේඛන කියවීම. උදා :- පොල්වත්තේ බුද්ධදත්ත හිමිගේ පාලි සාහිත්‍ය කෘතිය.<br>• මහාවංස, දීපවංස, රසවාහිනී, බොධිවංස, හත්ථවනගල්ලවිහාරවංස, ථූපවංස, සමන්තකූට වණ්ණනා, බාලාවතාර, රූපසිද්ධි, කච්චායන, මොග්ගල්ලායන යන කෘතීන් පිළිබඳව තොරතුරු හැදෑරීම. | 25 |
| 10.0 අර්ථ විවරණ හැකියා වර්ධනය කර ගනියි. | 10.1 නිර්දිෂ්ට කෘතිවල ඇතුළත් සුවිශේෂී පදවල ධර්මාර්ථ විවරණය කරයි.<br>10.2 නිර්දිෂ්ට කෘතිවල උධෘතයන්හි ව්‍යාකරණ විභාග (පද විග්‍රහ) කරයි. | • නිර්දිෂ්ට ග්‍රන්ථවල ධර්ම කරුණු අටුවා ඇසුරින් විග්‍රහ කිරීම<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල සුවිශේෂී පදවල ව්‍යාකරණ විභාග දැක්වීම | 20 |

## 4. 0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

පාලි භාෂාව පිළිබඳ අ.පො.ස. උ.පෙළ නව විෂය නිර්දේශය සකස් කර ඇත්තේ නිපුණතා පාදක කරගෙනය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රමුඛ ස්ථානයක් ගනී. අද වන විට විශේෂයෙන් අ.පො.ස. උ.පෙළ අධ්‍යාපන ක්‍රමය සකස් වී ඇත්තේ දේශන ක්‍රමය කේන්ද්‍ර කරගත් සම්ප්‍රේෂණ භූමිකාවක ගුරුවරයා සිටින අයුරෙනි. එහෙත් නව නිපුණතා පාදක අධ්‍යාපනයේ දී පැරණි සම්ප්‍රේෂණ භූමිකාව හැරදමා ගුරුවරයා සිසුන් ගවේෂණයට යොමුකරන මාර්ගෝපදේශකයෙකු, විය යුතුය. මෙහි දී පාලි භාෂාවට සුවිශේෂී අධ්‍යාපන ක්‍රම කීපයකුත් නවීන ක්‍රම ශිල්ප හා ඒවා යොදාගත හැකි ආකාරයත් පිළිබඳ කෙටියෙන් සටහන් කරමු.

බුදුරජාණන් වහන්සේ මාර්ග දර්ශකයාණෝය. ගුරුවරයා විසින් පාලි භාෂාව ඉගැන්විය යුත්තේ ඉහත බුදුරදුන් අනුගමනය කළ ක්‍රමවේදය උපයෝගී කරගෙනය. එනිසා නූතන ගුරුවරයා මනෝමූලික හා විෂය මූලික සාධක ඔස්සේ පූර්ව විනිශ්චයන්ට නො එළඹ ශිෂ්‍යයා ගවේෂකයෙකු හා නවෝත්පාදකයෙකු කිරීමට මාර්ගෝපදේශකයෙකු විය යුතුය. පාලි සාහිත්‍යයේ අන්තර්ගත එබඳු ඉගැනුම් ඉගැන්වීම් ක්‍රම කීපයක් මෙහිලා දැක්වීම පාලි ගුරුවරුනට මාර්ගෝපදේශයක් වනු ඇත.

<u>1 ක්‍රමය</u>

''යෝ ධම්මං දේසේති ආදි කල්‍යාණං මජ්ඣේ කල්‍යාණං පරියෝසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවල පරිපුණ්ණං පරිසුද්ධං''
(මහාවග්ග පාලි)

ආදි කල්‍යාණං - ආරම්භය යහපත්වීමයි. පාඩමක ආරම්භය ශිෂ්‍යයා පොළඹවන සිත්ගන්නා සුලු චමත්කාර අත්දැකීමක් ඇසුරින් ඉදිරිපත් විය යුතුය.

මජ්ඣේ කල්‍යාණං - පාඩමෙහි මැද සාරවත් කරුණු අන්තර්ගත විය යුතුය. පැහැදිලි හා නිරවුල් ඒවා විය යුතුය. තව තවත් ශිෂ්‍යයා මාතෘකාවට පොළඹවන ගවේෂකයෙකු කරන ඒවා විය යුතුය.

පරියෝසාන කල්‍යාණං - පාඩම මනාව අවසන් විය යුතුය. ශිෂ්‍යයා ප්‍රාප්ති මට්ටමකට පැමිණිය යුතුය. ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් විය යුතුය.

සාත්ථං පාඩම අර්ථවත් මාතෘකාවක් ඔස්සේ ගලා යන සරල සුගම එකක් විය යුතුය.

සබ්‍යඤ්ජනං - යොදා ගන්නා වාක්‍යමාලාව අරුත් ප්‍රකට කරවන අදහස් නිවැරදිව සන්නිවේදනය වන්නක් විය යුතුය.

සුද්ධං - පාඩම අසභ්‍ය ව්‍යහාරයෙන් තොර විය යුතුය.

කේවල පරිපුණ්ණං - ඌනතාවලින් තොරව භාෂණය, ලේඛනය, චින්තනය හා චරිතායනය කර ගැනීමට හැකිවන අංගයන්ගෙන් සමුපලක්ෂිත විය යුතුය.

මෙම ලක්ෂණ 7 න් යුතුව පාඩමක් මෙහෙයවීමෙන් ශිෂ්‍යයා නිපුණතාවට ළංවන අතර ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ද ඇති කළ හැකිය.

**2 ක්‍රමය**

මජ්ඣිම නිකායේ සච්චවිභංග සූත්‍රය.

පාලි සාහිත්‍යයේ ශිෂ්‍ය සාධනය ඔප් නැංවීමට උචිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් සච්චවිභංග සූත්‍රයෙහි අන්තර්ගතය.

ආචික්ඛනා - පාඩමට අදාළ අපේක්ෂිත කරුණු කෙටියෙන් කීමයි.

දෙසනා - කෙටියෙන් කී කරුණු ගුරුවරයා කෙරේ ප්‍රාමාණික විශ්වාසයක් ඇතිවන පරිදි ඉදිරිපත් කිරීම

පඤ්ඤපනා - ශිෂ්‍යයාගේ බුද්ධියට හා ප්‍රඥාවට යෝග්‍ය ලෙස කරුණු පෙළ ගැස්වීමයි.

පට්ඨපනා - අපේක්ෂිත අරමුණෙහි ශිෂ්‍යයා පිහිටුවීමයි.

විවරණා - වසා තිබූවක් විවෘත කරන්නා සේ කරුණු හේතු ඵල වාදීව පෙන්වා දීමයි.

විභජනා - කරුණු විශ්ලේෂණය කොට කුඩා අනුකුඩා කොටස්වලට බෙදා විග්‍රහ කිරීමයි.

උත්තානිකම්ම - සංයුක්ත සංකල්ප නිදසුන් වශයෙන් ගෙන හැර දක්වමින් ශ්‍රාවක බුද්ධියට ගෝචරවන ලෙස මතු කර දැක්වීමයි.

මෙම ක්‍රම හත අනුගමනය කිරීමෙන් ද ශිෂ්‍ය නිපුණතාව ඉහළ නැංවිය හැකි බව දැක්විය හැකිය.

**3 ක්‍රමය**

ශිෂ්‍යයන්ගේ අවබෝධය දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමය අනුපූර්ව ප්‍රතිපදාවකි. ශිෂ්‍යයාට අලුත් අත්දැකීමක් ලබාදෙන විට එය ඔහුගේ අතීත අත්දැකීම්වලට සම්බන්ධ දෙයක්වීම වැදගත් ය. ශිෂ්‍යයා ආස්වාදිත දෙයෙහි සිට නොදන්නා සත්‍ය කරා යොමුකරවීම මෙම අධ්‍යාපන ක්‍රමයේ පිළිවෙළයි.

සද්ධාජාතො උපසංකමති - ශ්‍රද්ධාව ඇති කර ගැනීමයි. ගුරුවරයා කෙරේ ශිෂ්‍යයාගේ විශ්වාසයක් ගොඩනගා ගැනීමයි. එසේ විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරුවරයා කරා, ගුරුවරයාගේ විෂය කරා එළඹෙයි.

පයිරුපාසති - විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරු ඇසුර ලබයි. ඇසුර ලැබීමට රුචිකරයි.

සෝතං ඕදහති - ගුරුවරයාගේ පාඩමට කන් යොමු කොට සාවධානව අවික්ෂිප්තව අසයි.

| | |
|---|---|
| සුත්වා ධාරේති | - ඇසූ පාඩම සිතෙහි දරා ගනියි. |
| අත්ථං උපපරික්ඛති | - දරාගත් කරුණුවල අර්ථය විශේෂයෙන් නුවණින් පරීක්‍ෂා කර බලයි. |
| ධම්මා නිජ්ඣානං ඛමන්ති | - කරුණු නුවණින් සසඳන විට එහි සත්‍යාසත්‍ය බව තේරුම් ගනියි. |
| ඡන්දො ජායති | - සත්‍යාසත්‍ය බව තේරුම් යාම නිසා ගුරුවරයාගේ පාඩමට රුචියක් ඇති වෙයි. |
| උස්සහති | - පාඩමේ කරුණුවල ප්‍රාප්ති මට්ටමට ළඟාවීමට උත්සාහ කරයි. |
| තුලෙති | - වෙනත් කරුණු හා තුලනය කර බලයි. |
| පදහති | - සන්සන්දනය කොට නිපුණතා මට්ටමට ළඟාවීමට වීර්ය කරයි. |
| සච්චං සච්ජිකරෝති | - සත්‍ය වූ තත්ත්වය අවබෝධ කර ගනියි. |
| පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති | - නුවණින් ද එය විනිවිද දකී. |

සරල අවස්ථාවේ සිට අනුක්‍රමයෙන් ගැඹුරට යන ආකාරයේ පිළිවෙළක් මෙහි දක්නට ඇත. පාලි භාෂාව විෂය කෙරේ ශිෂ්‍ය නිපුණතාවක් ඇති කිරීමේ දී මෙම ඉගැන්වීම් ක්‍රම උපයෝගී කර ගත හැකි ය. මෙබඳු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම රාශියක් පාලි සාහිත්‍යයේ අඩංගුය.

පාලි භාෂාවේ නව විෂය නිර්දේශය ඉගැන්වීම සරල සුගම ක්‍රමවේදයක් මෙහිලා දක්වමු. (ආශ්‍රය - පාලි භාෂාව 9 - 10 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1984).

i පියවර - නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාලි පාඨ හා ඡේද උස් හඬින් ගුරුවරයා විසින් කියවීමයි. පාලි විෂයයේ ආරම්භක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම භාෂාව කණට හුරු කරවීම මෙයින් අපේක්‍ෂා කෙරේ. පාලි භාෂා ව්‍යවහාරය දරුවන්ගේ ඇසට කණට හුරුකරවීම මෙම ක්‍රමය උපයුක්ත වේ.

ii පියවර - ඊළඟට ගුරුවරයා කළ යුත්තේ එම කොටස අර්ථවත් ආකාරයට ආරෝපණය කොට භාවාර්ථ පැහැදිලි කිරීමයි. මෙහිදී පාලි භාෂා ව්‍යවහාරය හා රීතිය ශිෂ්‍යයාගේ ඉන්ද්‍රියයන්ට හුරුවනු ඇත.

iii. පියවර - ඊළඟට කාල වේලාව අනුව පාලි උද්ධෘතය ශිෂ්‍යයන් ලබා සාමූහිකව හෝ වෙන් වෙන් වශයෙන් හෝ නිවැරදි උච්චාරණය සහිතව කියවීම ප්‍රයෝජනවත්ය.

iv  පියවර   - ඊළඟට පාලි උද්ධෘතයන්හි අර්ථය සිසුන්ට අවබෝධ කර ගැනීමට ගුරුවරයා උදව් කළ යුතුය.

v. පියවර   - උද්ධෘත ඡේදවල වාක්‍ය හා වාක්‍යාංශ කලුලෑල්ලේ ලියා එම යෙදුම් රටාව ශිෂ්‍යයාට පැහැදිලි කළ යුතුය.

vi  පියවර   - උද්ධෘත ඡේදවල ඇතුළත් පද හා වාක්‍යවල ව්‍යාකරණ ලක්‍ෂණ පැහැදිලි කළ යුතුය.  මෙය සරල ක්‍රම වේදවලින් පටන් ගෙන සංකීර්ණ ක්‍රම දක්වා වැඩි කිරීම සුදුසුය.

vii  පියවර  - වැදගත් ගාථා හා ඡේද වනපොත් කිරීමේ අවශ්‍යතාව ශිෂ්‍යයන්ට ඒත්තු ගැන්වීම අවශ්‍ය වෙයි.

මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම මගින් ශිෂ්‍යයන් අපේක්ෂිත නිපුණතා මට්ටමට ළඟා වනු ඇත. සිසුන් කරුණු හා තොරතුරු ගවේෂණයට යොමු කිරීම ගවේෂිත කරුණු අධීක්ෂණය, ගුරුවරයා කළ යුතුය. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය පන්ති කාමරයට පමණක් සීමා නොවී බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ද ශිෂ්‍යයා යොමු කිරීම ගුරුවරයාගේ යුතුකමකි. සිසු දරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරතුරු අවධියෙන් සිටීමෙන් ඇගයීම හා තක්සේරුව ද විනිවිදභාවයකින් යුතුව කිරීමට ගුරුවරයාට ඉඩකඩ සැලසේ. මෙම නව විෂයමාලා සංශෝධනයේ අපේක්ෂාව ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර වූ සම්ප්‍රේෂණ අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කර ක්‍රියාකාරී ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයකට යොමු කිරීමයි. එමගින් සිසුන්ගේ නිපුණතාව වැඩිකර සමාජයට රටට යෝග්‍ය පුරවැසියන් බිහිකිරීමයි.

## 5. 0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පංති කාමරයේ ඒකාකාරී ක්‍රියාවලියෙන් බැහැර නිපුණතා සංවර්ධනය සඳහා ශිෂ්‍යයා දැනුම ගවේෂණය කරන්නනෙකු බවට පත් කළ යුතුය. ඒ සඳහා පාලි භාෂාව විෂය ශිෂ්‍යයාගේ ආත්මගත කිරීමට වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය. පංති කාමරයෙන් බැහැරට පහත සඳහන් වැඩසටහන් සංවිධානය කිරීම පාලි භාෂාව පිළිබඳ නිපුණතාවන් වර්ධනයට උපයුක්ත වේ යයි සිතමු.

- පාලි බිත්ති පුවත් පතක් ක්‍රියාත්මක කිරීම.
- පාලි භාෂා දිනයක් වෙන් කර කටයුතු සංවිධානය කිරීම.
- ගාථා හා සූත්‍ර ගායනා තරඟ සංවිධානය කිරීම.
- පාලි කථික තරඟ සංවිධානය.
- පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ගවේෂණාත්මක ව්‍යාපෘති කරවීම.
- පාලි සමිතියක් පැවැත්වීම.

පාසලේ හෝ පිරිවෙණෙහි පසුබිමට හා සංස්කෘතියට අදාළවන පරිදි විද්‍යාස්ථානයේ මානව හා භෞතික සම්පත්වලට අනුකූල ලෙස මෙම ඉහත වැඩසටහන් සංවිධානය කර ගැනීම යෝග්‍යවේ.

මෙම විෂය නිර්දේශයේ නිපුණතාවන් සඵල කර ගැනීම සඳහා පහත සඳහන් කෘති නිර්දේශ කරමු.

## 6. 0 නිර්දිෂ්ට කෘති

**12 ශ්‍රේණිය**

ජාතකට්ඨකථා - වණ්ණුපථජාතක

සෙරිවාණිජජාතක

චුල්ලසෙට්ඨිජාතක

ථේරගාථා - භූතථෙරගාථා

ථේරීගාථා - පුණ්ණාථේරීගාථා

මහාවංස - 26 පරිච්ඡේදය

**13 ශ්‍රේණිය**

ජාතකට්ඨකථා - තණ්ඩුලනාලිජාතක

දේවධම්මජාතක

සුත්තනිපාත - රතනසුත්ත

ධම්මිකසුත්ත

ධම්මපදය - අත්තවග්ග

## 7. 0 අතිරේක කියවීම් :-

1. ධම්මපදට්ඨකථා
2. රසවාහිනී
3. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, පාලි සාහිත්‍යය, කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ, 2002.
4. පැණිහෙළ සිරිසම්බෝධි හිමි, පාලි භාෂාව හා රචනය, සමයවර්ධන, කොළඹ.
5. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, පාලි භාෂාවතරණය ෂෂල සමයවර්ධන, 1999.
6. New Pali Course I & II" Buddhist Cultural Centre.
7. අසෝක කරුණාරත්න, පාලි සංග්‍රහය. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964.

## 8. 0 තක්සේරු හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙන ඇත.